සැ. යු. - (i) 2017.10.20 වැනි දින පළ වූ අංක 2042 දරන *ගැසට් පත්‍රයේ* II කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2017 වර්ෂය සඳහා කොළඹ අධිකරණ කලාපයට අයත් ජූරි සභිකයින්ගේ නාමාවලියක් භාෂාත්‍රයෙන් ම පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,043 - 2017 ඔක්තෝබර් මස 27 වැනි සිකුරාදා - 2017.10.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | 142 |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 142 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 144 |


සැ. යු. - ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත 2017 ඔක්තෝබර් මස 13 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 නොවැම්බර් මස 17 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 නොවැම්බර් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම්

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

### වරින්වර සංශෝධිත 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 26 වගන්තිය ප්‍රකාර කෙරෙන දැන්වීමයි

වරින්වර සංශෝධිත 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 43 වැනි වගන්තිය ප්‍රකාර සංස්ථාපනය කල සංස්ථාපිත මණ්ඩල ආයතනයක් වන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපතිවරයා වන සම්පත් සුභසිංහ ආරච්චි වන මම පෙර කී ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 26 වැනි වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාව වෙත ලැබී ඇති බලතල ප්‍රකාර ආයෝජකයින් වෙතින් විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සහ නේවාසික අවශ්‍යතාවන් සඳහා නියමිත ආකෘතියෙහි ඉල්ලුම්පත්‍ර කැඳවීමට අපේක්ෂා කරන බව මෙමගින් දැනුම් දෙමි.

අදාල ආකෘති පත්‍ර බත්තරමුල්ල කඩුවෙල පාර අංක 475 ලිපිනයෙහි පිහිටි මෙම කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැකි බව වැඩිදුරටත් දැනුම් දෙමි.

සම්පත් සුබසිංහ ආරච්චි,<br>සභාපති.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,<br>අංක 475, කඩුවෙල පාර,<br>බත්තරමුල්ල.

10 -1117

---

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

උතුරු මැද පළාත් සභාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් පිහිලිඇලේ ගෙදර සුනිල් අබේකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19(4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 2011.10.20 දින ප්‍රදානය කර ඇති අංක අනු/රාජා/ප්‍ර/6387 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන රාජාංගනය යාය 11 පදිංචි අශෝක නවරත්න පියසිරි වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 7877 යටතේ 2011.11.29 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2017.11.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ රාජාංගනය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ දකුණු විලච්චිය කෝරළේ 453 ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ යාය 11 නැමැති ගමේ පිහිටා ඇත්තාවූ ද අනුරාධපුර මැනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ.ජ.සි.අ.: 16 දරන කට්ටි කැඩීමේ පිඹුරේ අංක 400 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් /අක්කර 00, රූඩ් 01, පර්චස් 22 ක් විශාලත්වය ඇත්තාවූද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 358 පාර රක්ෂිතය හා කැබලි අංක 399; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 399 කැබැල්ල හා කැබලි අක 401; |
| *දකුණට* | : | කැබලි අංක 401 හා කැබලි අංක 409 පාර රක්ෂිතය ; |
| *බස්නාහිරට* | : | කැබලි අංක 409 පාර රක්ෂිතය හා කැබලි අංක 358 පාර රක්ෂිතය. |

පී. ජී. සුනිල් අබේකෝන්,<br>ප්‍රාදේශීය ලේකම්,<br>රාජාංගනය.

2017 සැප්තැම්බර් මස 08 වැනි දින.

10-1507/1

**ඉඩම් සංවර්ධන ආඥපනතේ 19 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

උතුරු මැද පළාත් සභාවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් පිහිලිඇලේ ගෙදර සුනිල් අබේකෝන් වන මම, ඉඩම් සංවර්ධන ආඥ පනතේ 19(4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1994.08.15 දින ප්‍රදානය කර ඇති අංක අනු/රාජා/ප්‍ර/708 දරන ප්‍රදානපත්‍රයේ හිමිකරු වන රාජාංගනය යාය 12 පදිංචි අත්තනායක මුදලිගේ පොඩි අප්පුහාමි මහත්මයා වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 145 යටතේ 1995.01.23 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳ යම් විරෝධතාවයක් ඇත්නම් එය 2017.11.27 දිනට පෙර මාවෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, රාජාංගනය ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, දකුණු විලච්චිය කෝරළේ 454 ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසයේ යාය 12 නැමැති ගමේ පිහිටා ඇති, සර්වේ ජනරාල්වරයා විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක 01 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ජ. සි. අ. 14 දරන පිඹුරෙහි අංක 201 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර 02, රූඩ් 01, පර්චස් 03ක් ඇතැයි ගණන් බලා තිබෙන මඩ ඉඩම යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය :-

*උතුරට* : අංක 90 ඇල සහ පාර රක්ෂිතය ;
*නැගෙනහිරට* : අංක 199 කැබැල්ල ;
*දකුණට* : අංක 194 දියබස්නා ඇල ;
*බස්නාහිරට* : අංක 72 රජයේ ඉඩම.

පී. ජී. සුනිල් අබේකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
රාජාංගනය.

2017 සැප්තැම්බර් මස 08 වැනි දින.

10-1507/2

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියයේ (4) වන උප වගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය**

ඌව පළාත් සභාවේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කැබැද්දුව ගමගේ දෝන තනුක්ෂා නිලන්ති අබේවර්දන වන මම ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ලංකාණ්ඩුව විසින් 1982 මැයි මස 17 දින ප්‍රදානය කර ඇති අංක බදු/ප්‍ර 248 දරන දීමනා පත්‍රයේ හිමිකරු වන උඩුකුඹුල්වෙල, ඉලුක්වත්ත ලිපිනයේ පදිංචි හස්ත ජයවීර මුදියන්සේලාගේ ජයසුන්දර *නොහොත්* පොඩි මහත්තයා වෙත ප්‍රදානය කොට බදුල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 616 යටතේ 1982 වර්ෂයේ ජුනි 02 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇත. එබැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රිය කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2017.11.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

උපලේඛනය

බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුඹල්වෙල කෝරළයේ උඩුකුඹල්වෙල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ උඩුකුඹල්වෙල නැමති ගමේ පිහිටා ඇත්තා වූ බදුල්ල දිස්ත්‍රික් මැනුම් අධිකාරී භාරයේ ඇති සර්වේ ජනරාල් විසින් සම්පාදිත අංක අ. ග. සි. 27 දරන පිඹුරේ 308 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම්කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් රූඩ්. 02යි පර්චස් 30ක් විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූද රජයේ ඉඩම කටුගහකන්දේ පතන

*උතුර* : කැබලි අංක 307;
*නැගෙනහිර* : කැබලි අංක 305, 309;
*දකුණ* : කැබලි අංක 310;
*බටහිර* : කැබලි අංක 427

කේ. ඩී. තනුක්ෂා එන්. අබේවර්දන,
ප්‍රාදේශීය ලේකම්,
ඇල්ල.

2017 ජූලි මස 06 වැනි දින.

10-1506

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/25996.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : EP/28/LES/BAT/
MN/287.

**අංක 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 172 බී, තිරුච්චෙන්දූර් ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තිරුච්චෙන්දූර් ගමේ පීපී මඩ 2112 පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0335 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් නේවාසික කටයුතු සඳහා සුගන්දමලර් රාසමානික්කම් මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දක්වේ : -

| | | |
|---|---|---|
| *උතුරට* | : | පීපී මඩ 72 හි කැබලි අංක 47 ; |
| *නැගෙනහිරට* | : | පීපී මඩ 72 හි කැබලි අංක 47 සහ 48 ; |
| *දකුණට* | : | පීපී මඩ 72 හි කැබලි අංක 48 සහ 47 ; |
| *බටහිරට* | : | පීපී මඩ 72 හි කැබලි අංක 47. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ :-

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30), (1995.06.15 සිට 2025.06.14).

*වාර්ෂික බදු මුදල* .- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 1995 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4%කි.

*දඩ මුදල*.- ඉඩමේ දියුණු වටිනාකමින් 4% බැගින් වූ මුදල මෙන් තුන් ගුණයකි ;

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය ;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම නේවාසික කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය ;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඉ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2017.05.15 දින සිට වසර 05ක් ගතවන තුරු පවුල තුළ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ./ මෙම බදුකරය සඳහා දීමනා පත්‍රයක් ලබා ගැනීමේ හිමිකම 2017.05.15 දින සිට වසර 05ක් ගතවීමෙන් පසු හිමිවේ;

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත;

*(එ)* නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ඉඩම අන්සතු කිරීමේ දී නියම කරන ලද කාලසීමාව තුළ නිවාස කටයුතු සම්පූර්ණ කළ යුතු අතර, එසේ කිරීමට අසමත් වුවහොත් බදු ඔප්පුව අහෝසි වූවා සේ සැලකෙන අතර, රජය වෙත නැවත ඉඩම පැවරීම සිදු වේ.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ජී. ප්‍රණවන්,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2017 ඔක්තෝබර් මස 27 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'',රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10-689

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය: 4/10/51309.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය: NP/28/0402/
SLO/42/1199.

**21 (2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනය**

මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම නගරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් තිරුකේදීශ්වරම් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ තිරුකේදීශ්වරම් ගමේ දළ අනුරේඛනයේ දක්වෙන ප්‍රමාණයෙන් රූඩ්.03, පර්.26 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ල ළමා නිවාසයක් පවත්වාගෙන යාම සඳහා ශිවන් අරුල් නිවාසයේ භාරකාර මණ්ඩලය වන නමසිවායම් සිවයෝගරාජා මයා (සභාපති) කුරුපරන් ඉන්දු ප්‍රියදර්ශනී මිය (ලේකම්) කණපදිප්පිල්ලෙ තිරුනාවුකරසු මයා (භාණ්ඩාගාරික) විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දක්වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | පාර; |
| *නැගෙනහිරට* | : | පාර; |
| *දකුණට* | : | පාර; |
| *බටහිරට* | : | ශිවන් අරුල් ඉල්ලම්. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන, එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම් බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය*.- අවුරුදු තිහයි (30) (2017.08.09 සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2017 වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 1/2% කි.

*වාර මුදල* .- නැත.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුද්දක් ඇතුළතදී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතුය;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම ළමා නිවාසයක් පවත්වාගෙන යාම සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතුය;

*(ඉ)* සාද ඇති/ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්වයකින් පවත්වාගෙන යා යුතුය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2017.08.09 දින සිට අවුරුදු පහක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක;

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

ඩී. ටී. එම්. ජයතිලක,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට.

2017 ඔක්තෝබර් මස 27 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාරේ අංක 6/1200 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

10 - 1034

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.